# දැන්වීමයි

## මැතිවරණ කොමිෂන් සභාව

### 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4)(අ) වගන්තිය යටතේ දැන්වීම

01. 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ ( සංශෝධන) පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4)(අ) වගන්තිය අනුව මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීම සඳහා වූ අයදුම්පත් 2026.01.28 වන දින සිට 2026.02.28 දින ප.ව 3.00 දක්වා භාරගනු ලැබේ. අදාළ අයදුම්පත් මැතිවරණ කොමිෂන් සභාව වෙත අදාළ පක්ෂයේ ලේකම්වරයා විසින් ලියාපදිංචි තැපැලෙන් යොමු කිරීමට හෝ පැමිණ භාරදීම සිදු කළ හැකිය. එම අයදුම්පත් යොමු කිරීමේ දී ලිපිකවරයේ ඉහළ වම්පස "දේශපාලන පක්ෂ පිළිගැනීම වෙනුවෙන් අයදුම් පත්‍රය - 2026 " යනුවෙන් සඳහන් කළ යුතු වේ. ලියාපදිංචි තැපැලෙන් එවනු ලබන අයදුම්පත් සභාපති , මැතිවරණ කොමිෂන් සභාව , සරණ මාවත, රාජගිරිය (10107) යන ලිපිනයට යොමු කළ යුතු වේ.

02. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයෙහි නියමිත වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියා කරනු නොලැබේ.

03. දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීම සඳහා ඉල්ලුම් කරනු ලබන අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර අංක **2472/21** හා **2026.01.21** දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් නිර්ණායක අනුව නියමිතව සකස් කරන ලද ලේඛන ද සමඟ පක්ෂයේ ලේකම්වරයා විසින් අත්සන් කරනු ලැබ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

04. අයදුම්පත්‍රය, මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.election.gov.lk) මඟින් බාගත කර ගත හැකි අතර, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් හා මැතිවරණ මහලේකම් කාර්යාලයෙන් ද අදාළ අයදුම්පත ලබා ගත හැකිය.

05. පක්ෂය පිළිගනු ලැබුවහොත් අංක **2471/24** හා **2026.01.13** දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් අනුමත කරන ලද (ආ) උප ලේඛනයේ සඳහන් පක්ෂ ලකුණු අතුරින් එම පක්ෂය සඳහා වෙන් කරගනු ලැබීමට අපේක්ෂා කරනු ලබන්නේ කවර ලකුණක් ද යන්න එම ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කළ යුතුය.

06. අයදුම් පත්‍රය සම්පූර්ණ කර ඒ සමඟ පහත සඳහන් ලේඛනවල සහතික කළ ඡායා පිටපත් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය වුවහොත් මුල් පිටපත් පරීක්ෂා කර බලනු ඇත.

6.1 පක්ෂ ව්‍යවස්ථාව
6.2 පක්ෂයේ නිලධාරී මණ්ඩලයේ ලැයිස්තුව
6.3 පක්ෂයේ කාන්තා නිලධාරීන්ගේ නම් (පසුගිය වසර 04 ක)
6.4 පක්ෂයේ විගණනය කර ලද ගිණුම් ප්‍රකාශ (අයදුම්පත ඉදිරිපත් කරන වසරට පූර්ව වසර හතරක කාලය සඳහා)
6.5 පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය.
6.6 දේශපාලන පක්ෂයක් වශයෙන් ආසන්නතම වූ වසර හතරකවත් කාලය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක වූ බව සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි සියලුම ලිපි ලේඛන වෙන වෙනම ගොනු 04ක වර්ෂ අනුව බෙදා ඉදිරිපත් කළ යුතුය.

07.පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීමට කෙරෙන ඉල්ලීමක් සම්බන්ධයෙන් 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ ( සංශෝධන) පනතෙන් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(5) ,(6) හා (7) යන නියමයන් තීරණාත්මක හා අවසානාත්මක වේ.

08.ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ දී අංක **2472/21** හා **2026.01.21** දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ දේශපාලන පක්ෂ පිළිගැනීම සම්බන්ධ 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(9) උප වගන්තිය අනුව පනතේ 7 වන වගන්තියෙහි සඳහන් මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම බලාත්මක කිරීම හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධාන අනුව කටයුතු කර ඇති බව සනාථ කළ යුතු වේ.

**ආර්.එම්.ඒ.එල්. රත්නායක**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහ ලේකම් කාර්යාලය,
සරණ මාවත, රාජගිරිය (10107)
2026 ජනවාරි මස 28 වන දින දීය.

සටහන -මේ පිළිබඳව 1981 අංක 1දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධාන පරිශීලනය කිරීම යෙහෙකි.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා **26/**

# මැතිවරණ කොමිෂන් සභාව

## 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත
## දේශපාලන පක්ෂ පිළිගැනීම
## 2026
### අයදුම්පත

**1.** දේශපාලන පක්ෂයේ නම :
(සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම සඳහන් කිරීම අනිවාර්ය වේ.)

I. සිංහල - ..........................................................................................

II. தமிழ் - ..........................................................................................

III. English - ..........................................................................................

**2.** යෝජිත පක්ෂ ලකුණ : ........................................................
(අංක **2471/24** හා **2026.01.13** දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ (ආ) උප ලේඛනයේ සඳහන් ලකුණු අතරින් තෝරා ගත යුතු ය.)

**3.** පක්ෂ කාර්යාලයේ ලිපිනය : ..........................................................................................
..........................................................................................

**4.** පක්ෂ කාර්යාලයේ දුරකථන අංකය
4.1 ස්ථාවර : ..............................
4.2 ෆැක්ස් : ..............................
4.3 විද්‍යුත් ලිපිනය : ..........................

**5.** පක්ෂ ලේකම්වරයාගේ නම : ..........................................................................................

**6.** පක්ෂ ලේකම්වරයාගේ ජාතික හැඳුනුම්පත් අංකය : ......................................................

**7.** පක්ෂ ලේකම්වරයාගේ ලිපිනය : ..........................................................................................
..........................................................................................

**8.** පක්ෂ ලේකම්වරයාගේ දුරකථන අංකය : ජංගම දුරකථන අංකය - ..................................
ස්ථාවර දුරකථන අංකය - ..................................

**9.** පක්ෂ ලේකම්වරයාගේ විද්‍යුත් තැපැල් ලිපිනය : ......................................................

**10.** පක්ෂ පිළිගැනීම සඳහා මින් පෙර ඉල්ලුම් කර තිබේ නම්,
10.1 ඉල්ලුම් කරන ලද වර්ෂය : ..................................................
10.2 ඉල්ලුම් කරන ලද පක්ෂ නාමය : ..................................................
10.3 එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබූ දිනය : ..................................................

**11.** අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන
**(සියලු ලේඛන පිළිවෙලට අංක කර පිටපත් දෙකකින් වෙන වෙනම ඉදිරිපත් කළ යුතු ය.)**

| ලේඛනය | ඇත | නැත |
|---|---|---|
| 11.1 පක්ෂ ව්‍යවස්ථාව | | |
| 11.2 පක්ෂයේ නිලධාරී මණ්ඩලයේ නම් ලැයිස්තුව | | |
| 11.3 පක්ෂයේ නිලධාරී මණ්ඩලයෙහි කාන්තා නිලධාරීන්ගේ නම් ලැයිස්තුව (වසර 04ක) | | |
| 11.4 ලියාපදිංචි විගණකවරයකු විසින් විගණනය කරන ලද පක්ෂයට අදාළ ගිණුම් ප්‍රකාශ | | |
| 11.5 පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය | | |
| 11.6 වසර 4ක දේශපාලන ක්‍රියාකාරීත්වය සනාථ කෙරෙන තොරතුරු ඇතුළත් ගොනුව ( එක් එක් වර්ෂය සඳහා වෙන වෙනම ගොනු සකස් කර ඉදිරිපත් කළ යුතු ය.) | | |

**12**. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(5)(ආ)(ii)(අ) හෝ (ආ) වගන්තිය ප්‍රකාරව පිළිගැනීම සඳහා ඉල්ලුම් කරන්නේ නම්;

12.1 මෙම පක්ෂය ස්වාධීනව හෝ සන්ධානගතව පසුගිය පාර්ලිමේන්තු මැතිවරණ සඳහා තරග කර ඇත් ද?

........................................................................................................

12.2තරග කර ඇත්නම්, තරග කරනු ලැබූ මැතිවරණ කොට්ඨාස :........................................

12.3ජයග්‍රහණය කරන ලද මන්ත්‍රී ධූර සංඛ්‍යාව : .......................................................................

12.4සන්ධානගතව තරග කරන ලද්දේ නම්, සන්ධානගත වූ පක්ෂයේ / සන්ධානයේ නම :

..............................................................................................................................

12.5සන්ධානය තුළ පක්ෂයේ සාමාජිකයන් තරග කරනු ලැබ ඇත්නම්,

12.5.1 තරග කරනු ලැබූ සාමාජිකයන් සංඛ්‍යාව : ............................................................

12.5.2 තරග කරනු ලැබූ සාමාජිකයන්ගේ තොරතුරු : ............................................................

| අනු අංකය | තරග කරන ලද සාමාජිකයාගේ නම | ලිපිනය | තරග වැදුණු දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| i | | | |
| ii | | | |
| iii | | | |
| iv | | | |
| v | | | |
| vi | | | |
| vii | | | |
| viii | | | |

12.6 අදාළ සන්ධානගත වීමට අදාළ ලිපිය/ අවබෝධතා ගිවිසුම | ඇත | නැත |

(අදාළ ලිපියේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.)

.............................................................. (දේශපාලන පක්ෂය) සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලේඛන මාගේ දැනුම පරිදි සත්‍ය හා නිවැරදි බව ද මෙයින් ප්‍රකාශ කරමි.

.....................................
දිනය

.........................................................
ලේකම්වරයාගේ අත්සන
නිල මුද්‍රාව